**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - 2020**

**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 මතය

**-------**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**-------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) එකතුව රු. 7,053,294 ක් වූ ලැබිය යුතු ශේෂ 11 ක් සඳහා වර්ෂ 01 සිට වර්ෂ 03 දක්වා කාලයක් ගත වී ඇති නමුත් එම ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂයන් අතර තැන්පත් කිරීම් රු.මිලියන 2 ක් පවතින අතර අදාල සේවය තවමත් ලබා ගන්නා බැවින් අයකර ගත නොහැක.<br>අනෙකුත් ශේෂයන් අයකර ගැනීම සහ නිරවුල් කරමින් පවතින අතර 2021 ගිණුම් වර්ෂය සඳහා ගලපනු ලැබේ. | ලැබිය යුතු ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (අ) විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු සඳහා විදේශගත වූ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 34 දෙනෙකු හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ දෙදෙනෙකු නැවත සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 19,705,186 ක් බැඳුම්කර කඩවීම මත විශ්වවිද්‍යාලයට අයවිය යුතුව පැවතුණි. | 2020 වර්ෂයේ රු. 17,548,926.93 ක් අය කර ගැනීමට කටයුතු සිදු කර ඇත. තවද නිලධාරීන් 15 දෙනෙකු සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර නිලධාරීන් 12 දෙනෙකු සඳහා මූලික පරීක්ෂණ පැවැත්වීමටත් නිලධාරීන් 7 දෙනෙකුගේ අර්ථ සාධක අරමුදලෙන් අයකර ගැනීමටද කටයුතු සිදු කරමින් පවතී. | විශ්වවිද්‍යාලයට අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) සමාලෝචිත වර්ෂය තුළදී චෙක්පත් මඟින් හා මුදලින් නිකුත් කර තිබූ එකතුව රු. 1,069,879 ක අත්තිකාරම් 06 ක් හා 2018 හා 2019 වර්ෂවල නිකුත් කළ එකතුව රු. 83,027 ක් වූ අත්තිකාරම් 3 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. | 2020 වර්ෂයේ පැවැත්වීමට නියමිතව තිබූ උපාධි ප්‍රදානෝත්සවය සඳහාත්, වර්ණ ප්‍රදාන උළෙල සඳහාත් ශාලා වෙන් කරවා ගැනීමට අත්තිකාරම් ලබාදුන් අතර රටේ පැවති COVID තත්වය හේතුවෙන් එම උත්සව පැවැත්වීමට නොහැකි විය. එම නිසා එම මුදල් තැන්පතු ලෙස එම ආයතන තුළ රඳවා තබා ගෙන ඇත.<br>තව ද "The Economist" සඟරාව සඳහා 2020.12.31 දිනට පෙර පියවීමට නොහැකි වුයේ රටේ පැවති COVID තත්වය මත සිංගප්පූරුවේ සිට එම සඟරාව ගෙන්වා ගැනීමට නොහැකි වීම මත අදාල ඉන්වොයිසිය එම ආයතනයෙන් නොලැබීම හේතුවෙනි. | අතුරු, අග්‍රිම හා අත්තිකාරම් සම්බන්ධව මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | (ii) තත්ත්කාර්ය අතුරු අග්‍රිම උපරිම සීමාව වූ රු.100,000 ඉක්මවා නිලධාරීන් 02 දෙනෙකුට අවස්ථා 13 කදී එකතුව රු. 1,561,800 ක් ලබාදී තිබුණි. | පාලක සභා රැස්වීම් සඳහා සහභාගී වන සමාජිකයින්ට සාමාජික දීමනාව හා ප්‍රවාහන දීමනාව ලබා දීම සඳහා උපකුලපති අනුමැතිය ලබාගෙන රු. 100,000.00 ඉක්මවූ අත්තිකාරම් මුදලක් ලබා දී ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii)මුදල් රෙගුලාසි 571 (2) | 2016,2017,2018 යන වර්ෂවල ලද එකතුව රු. 1,486,675 ක් වූ ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු 107 ක් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම තැන්පත්කරුවන් හට ලිඛිතව දැනුවත් කලද ඔවුන් එම මුදල් නැවත ඉල්ලා නොසිට ඊලග ටෙන්ඩර් තැන්පතු වාරය සඳහා දිගින් දිගට පවත්වා ගන්නා අතර ඔවුන්ගේ කාලය අවසන් වූ පසු එම ටෙන්ඩර් තැන්පතු ආපසු ගෙවනු ලැබේ. ඔවුන් එම මුදල් නැවත ඉල්ලා නොසිටියහොත් ඉදිරියේදී අදායමට ගැනීමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ)විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සහ උසස් අධ්‍යාපන ආයතන සංග්‍රහය<br>----------------- | | | |
| XX වෙනි පරිච්ඡේදයේ 3.1 වගන්තිය | අධ්‍යයන සේවකයින්ගේ පැමිණීම, පිටවීම සහ නිවාඩු සම්බන්ධයෙන් ලේඛන නඩත්තු කර නොතිබුණි. පැමිණීම පිටවීම සනාථ කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතු බවට පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවේදී උපදෙස් ලබා දී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මෙය විශ්වවිද්‍යාල පද්ධතියටම බලපාන කරුණක් වන බැවින් මේ සම්බන්ධයෙන් තීරණයක් ගෙන කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපදෙස් දිය යුතුය.<br>මෙම කරුණ පෙර වර්ෂ වලදීද පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවේ සාකච්ඡාවට භාජනය විය. | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ විධිවිධාන හා පොදු ව්‍යාපාර පිළිබඳ කමිටු උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

---

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 146,550,951 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 871,320,870 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 724,769,919 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට අභ්‍යන්තර ආදායම අඩුවීම, පෞද්ගලික පඩිනඩි, ක්ෂය සහ අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018, 2019 වර්ෂවලදී බාහිර විභාග පාඨමාලා ගාස්තු සහ සම්මන්ත්‍රණ සඳහා සිසුන්ගෙන් ලද රු. 172,295,076 ක් අදාළ පාඨමාලා සහ සම්මන්ත්‍රණ නොපැවැත්වීම හේතුවෙන් විලම්භිත ආදායම් ලෙස දක්වා තිබුණි. | මෙම පාඨමාලා සඳහා වියදම් ඉදිරි වර්ෂ වල දැරීමට සිදුවීම හේතුවෙන් පාඨමාලාවේ ඉදිරි වර්ෂ සඳහා ලැබීම් විගණන ප්‍රමිතීන් අනුව විලම්භිත කිරීමට කටයුතු කර ඇත. | නියමිත කාල සීමාවන් තුළදී පාඨමාලා සහ සම්මන්ත්‍රණ පැවැත්වීමට කටයුතු කළ යුතුය. |
| (ආ) නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ව්‍යාපෘතිය කර ගෙන යාමේ හැකියාව නිශ්චය කිරීමකින් තොරව ශ්‍රවනාගාරය ඉදිකිරීමට අදාළ කාර්යය වෙනුවෙන් උපදේශන ගාස්තු හා සැලසුම් සකස් කිරීම වෙනුවෙන් 2016 ජුනි 22 දින රු. 5,794,676 ක මුදලක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂය දක්වා එම කාර්යය ඉටු නොකිරීම හේතුවෙන් දරන ලද වියදම අනාර්ථික වියදමක් වී තිබුණි. | ගිණුමේ පවතින රු. 5,794,676/- ක වියදමක් ඇත්තේ උපදේශන සේවා ආයතනය විසින් සැලසුම ඉදිරිපත් කිරීමට වන අතර එය විශ්වවිද්‍යාලය වෙත ලැබී ඇත. ප්‍රතිපාදන නොමැති බැවින් කොන්ත්‍රාත්තු ප්‍රදානයක් සිදු කර නොමැති අතර නව ව්‍යාපෘතියක් ලෙස මහා භාණ්ඩාගාරය මඟින් ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇත. | නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ව්‍යාපෘති ආරම්භ කළ යුතු අතර අවම පිරිවැයක් යටතේ ව්‍යාපෘති ඉටුකර ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුය. |
| (ඇ) වෛද්‍ය පීඨය සඳහා මෙත් සෙවන ඉඩමෙන් අක්කර 6.5 ක බිම් ප්‍රමාණයක් පවරා ගැනීම වෙනුවෙන් 1994 ජුනි 29 දින ගෙන තිබුණු අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 1998 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා අවස්ථා 3 කදී රු. මිලියන 24 ක්ද, 2019 වර්ෂයේ රු. මිලියන 50 ක්ද වශයෙන් රු. මිලියන 74 ක් බස්නාහිර පළාත් සභාවට ගෙවා තිබුණද, අදාළ ඉඩම පවරා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂයේ අවසාන වන විටත් සිදුකර නොතිබුණි. | මෙතෙක් ගෙවීම් සිදු කර ඇත්තේ පවරා ගන්නා ලද කොටස් සඳහා වේ. ඉතිරි ඉඩම් ප්‍රමාණය ලබා ගැනීම සඳහා අඛණ්ඩව රැස්වීම් පවත්වනු ලබන අතර ඉක්මනින් විශ්වවිද්‍යාලයට ලබා ගැනීම විශ්වවිද්‍යාලයේද අභිප්‍රාය වේ. | ඉඩම පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වූ වර්ෂ 06 ක කාල සීමාවක් තුල විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් සඳහා විවිධ පර්යේෂණ 366 ක් වෙනුවෙන් ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 669 ක් සඳහා පර්යේෂණ හා ප්‍රකාශන කමිටුවේ අනුමැතිය ලබා දී තිබුණි. ඉන් ඉවත් කර ගැනීම් හා මුදල් ලබා නොගැනීම මත පර්යේෂණ 31 ක් නවතා දමා තිබූ අතර පර්යේෂණ 173 ක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට සම්පූර්ණ කර නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 14.89 ක ප්‍රතිපාදන අනුමත වූ කථිකාචාර්යවරුන් 31 දෙනෙකු වාර්තාවේ දිනය දක්වාම පර්යේෂණ කටයුතු ආරම්භ කර නොතිබීම හේතුවෙන් වෙනත් කථිකාචාර්යවරයෙකුට ඒ සඳහා වූ අවස්ථාව අහිමි වී තිබුණි. | පර්යේෂණ සභාව විසින් නිරන්තරයෙන් පර්යේෂණ සම්බන්ධයෙන් සමාලෝචනය කරනු ලබන අතර මෙම වාර්තාවට අදාල තොරතුරු ලබාදීමෙන් පසු පර්යේෂණ 12ක් අවසන් කර වාර්තා ලබා දී ඇති අතර තවත් වාර්තා ප්‍රමාණයක් සඳහා දින දීර්ඝ කිරීමට කටයුතු කර ඇත. | පර්යේෂණ ප්‍රදාන උපයෝජනය කර අදාල කාල සීමාවන් තුලදී නිමකරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට ත්‍යාග හා ශිෂ්‍යත්ව අරමුදල් 102 ක් යටතේ පැවති රු. 35,527,763 කින්, අරමුදල් 98 ක් යටතේ වූ රු. 32,839,003 ක් අදාළ අරමුණ වෙනුවෙන් උපයෝජනය කිරීමකින් තොරව අක්‍රීයව පැවතුණි. | ශිෂ්‍යත්ව සහ ත්‍යාග අරමුදල් ආරම්භකොට ඇත්තේ විශේෂ අරමුණක් හෝ පරමාර්ථයක් සඳහාය. අදාල අරමුණ හා නිර්ණායකයන් ලඟා කර ගැනීමට සමත් වුවහොත් පමණක් උපයෝජයන කරනු ඇත. මෙම වර්ෂය තුල උපාධි ප්‍රදානෝත්සවය නොපැවැත්වීම මතද මෙම අරමුදල් උපයෝජනය අවම මට්ටමක පැවතුණි. අරමුදලේ ආදායම පමණක් වියදම් කරනු ලබන අතර ආයෝජන මුදල ඉදිරියට පවත්වා ගැනීම සිදු කරනු ලබයි. | ත්‍යාග හා ශිෂ්‍යත්ව අරමුදල් පිහිටුවීමේ අරමුණු ඉටු කිරීම සඳහා අදාළ මුදල් උපයෝජනය කළ යුතු ය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයේදී ශේෂය රු. 36,658,732 ක් වූ පර්යේෂණ අරමුදල් ගිණුම් 28 ක් වසර 05 කට වඩා වැඩි කාලයක සිට උපයෝජනය කර නොතිබුණු අතර එකතුව රු. 22,503,744 ක් වූ අරමුදල් ගිණුම් 47 ක් හා එකතුව රු. 347,586,262 ක් වූ විශේෂ අරමුදල් 28 ක් සමාලෝචිත වර්ෂය තුළ දී උපයෝජනය කර නොතිබුණි. | විවිධ ආයතන විසින් ලබා දී ඇති ප්‍රදාන අදාළ කාර්යයාන් සඳහා පමණක් භාවිතා කරනු ලබන අතර 2020 වර්ෂය තුළ අරමුදල් ඌණ උපයොජනය සඳහා කොවිඩ් - 19 බලපෑම්ද ඇති කරන ලදී. විශේෂ අරමුදල් එක් එක් දෙපාර්තමේන්තුව විසින් ජනනය කරන ලද ආදායම් වන අතර එම ආදායම් අරමුදල් පිහිටුවීමේ අරමුණු අනුව උපයෝජනය කරනු ලැබේ. 2020 වර්ෂයේ කොවිඩ් - 19 බලපෑම් අනුව ඌණ උපයෝජනය දක්නට ලැබේ. | පර්යේෂණ අරමුදල් පිහිටුවීමේ අරමුණු ඉටු කිරීම සඳහා මුදල් උපයෝජනය කළ යුතු ය. |